# ශ්‍රී ලංකා ආර්ථිකය

මෙරට ආර්ථිකය ඉතා පහත් මට්ටමකට පත්වී ඇති බව දැනගැනීමට බටහිර ආර්ථික විද්‍යාඥයකු වීමට අවශ්‍ය නැත. සන්ධාන ආණ්ඩුව බලයට පත්වී මාස පහක් යෑමට ද මත්තෙන් ආර්ථිකය මෙතරම් දුර්වලවූයේ කෙසේ ද? පසුගිය එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව සමයේ දී ද ආර්ථිකය එතරම් යහපත් මට්ටමක තිබුණා නො වෙයි. එහෙත් පසුගිය මාස පහක පමණ කාලයෙහි ආර්ථිකයේ කඩා වැටීමක් පෙන්නුම් කෙරෙයි.

මෙයට හේතුව සන්ධාන ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය ද? එසේත් නැත්නම් ඩොලරයට හා පවුමට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටීම ද? ඊනියා ලෝක වෙළෙඳ පොළෙහි තෙල් මිල ඉහල යෑම ද? තෙල් බැරලයක මිල ඩොලර් හැට දක්වා වැඩිවීමට ඉඩ ඇතැයි ඇතැම්හු කියති. තෙල් මිල ඉහල යන්නේ නයිජීරියාවෙ හා වෙනිසියුලාවේ ඇති වී තිබෙන අර්බුද හේතුකොටගෙන ද? එසේත් නැත්නම් ඇමරිකාව හා බ්‍රිතාන්‍ය විසින් ඉරාකය ආක්‍රමණය කරනු ලැබීම නිසා ද? මේ ප්‍රශ්නවලට විවිධ පිළිතුරු ඊනියා ආර්ථික විද්‍යා විශේෂඥයන්, ලෝක ප්‍රවෘත්ති විශ්ලේෂකයන් ආදී වශයෙන් මෙරට ප්‍රබුද්ධයන් සේ වැජඹෙන පිරිස් ජනමාධ්‍ය ඔස්සේ ඉතා බැරෑරුම් ආකාරයකින් ජනතාවට කියා දෙති. එහෙත් මේ බොහොමයක් පිළිතුරු මේ ඊනියා ප්‍රබුද්ධයන් කියවන බටහිර සඟරාවල පලවන පල්හෑලි බව සාමාන්‍ය ජනතාව නොදනිති.

භාණ්ඩ මිල ඉල්ලුම හා සැපයුම මත රඳාපවතින්නේ වැඩිවශයෙන්ම ආර්ථික විද්‍යා පොත්වල ය. අනෙක් අතට ඉල්ලුම හා සැපයුම යන්න ද නිදහසේ තීරණයකෙරෙන දැට වඩා මෙහෙයවෙන දෑ ය. අඩුම තරමේ ආර්ථික විද්‍යා පොතකට ඇති ඉල්ලුම පවා නිදහසේ තීරණය වන්නක් නො වෙයි. ලෝකයේ බොහෝ මිනිසුන් තේ පානය කරත්දී ද ඊනියා ලෝක වෙළෙඳ පොළේ තේ මිල පහත මට්ටමක පවතියි. එහෙත් තෙල් මිල දිනෙන් දින ඉහළ යයි. මේවා ලෝක බලවතුන්ගේ ඇඟිලි ගැසීම්වලින් තොරව සිදුවන්නේ යැයි සිතීමට අපට කියා දෙන්නෝ ද ලෝක බලවත්තුම වෙති. බටහිර නොවන භෞතික විද්‍යාවක් ගැන සිතීමට හැකි වුව ද බටහිර නොවන ආර්ථික විද්‍යාවක් ගැන තවම සිතීමට පවා නො හැකිය. බෞද්ධ ආර්ථිකය යනු ෂුමාකර් මහතා අනුගමනය කරමින් ඉදිරිපත්කරන වචන ටිකක් පමණකි. ත්‍රිපිටකයේ බෞද්ධ ආර්ථික විද්‍යාවක් ගැන සඳහන්වන්නේ යැයි කියන්නෝ බුදුන්වහන්සේට අගෞරව කරති.

පසුගිය ආණ්ඩුව සමයේදීත් රුපියලේ අගය ඩොලරයට, පවුමට හා යුරෝවට සාපේක්ෂව පහත වැටුණි. එහෙත් මේ වන විට එ් පහත වැටීමේ සීඝ්‍රතාව වැඩි වී ඇතැයි කියැවෙයි. සන්ධාන ආණ්ඩුව මෙයට වගකිව යුතු ද? මේ ආණ්ඩුවේ හා පසුගිය ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති අතර සැලකිය යුතු වෙනසක් දක්නට නැත. දහසක් වැටුප් ව්‍යාපෘතිය හා උපාධිධාරීන්ට රැකියා ලබාදීම එ් ප්‍රතිපත්ති අතර ඇති වෙනසකි. එහෙත් එ් නිසා සන්ධාන ආණ්ඩුව යටතේ ආර්ථිකය කඩා වැටෙන්නේ යැයි කිවහැකි නො වෙයි.

පසුගිය අවුරුදු පණහක පමණ කාලයෙහි දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන ආණ්ඩු බලයට පත් වූ විට ආර්ථිකයේ කඩා වැටීම වේගවත්වන බව ය. එසේ සිදුවන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවිධිමත් පරිපාලනය, එයට ආර්ථික විනයක් නොමැතිවීම ආදිය නිසා යැයි සිතීමට බටහිර ආර්ථික විද්‍යාව කළමනාකරණය ආදිය උගත්තෝ අපට කියා දෙති. 1948 යම් දේශපාලන නිදහසක් ලැබෙන විට මෙරට ආර්ථිකය අනෙක් යටත්විජිත සමග සන්සන්දනයකිරීමේ දී ඉතා යහපත් මට්ටමක තිබූ බවත් 1955 දක්වා ම අප එය රැකගත් බවත් එහෙත් 1956න් පසුව කඩාවැටීම ආරම්භ වූ බවත් අපට උගත්තු කියා දෙති. පණස්ගන්වල මුල්භාගයේ හා එයට පෙර සිංගප්පූරුව වැනි රටක් ලංකාව ආදර්ශයට ගැනීමට පුල පුලා සිටි බවත් එහෙත් ඉන්පසු අප සියල්ල විනාශ කරගත් බවත් කියැවෙයි. එ් අතර පණස්හයේ භාෂා ප්‍රතිපත්තිය නිසා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් ඇති වූ බවත් මහදැනමුත්තෝ අපට කියා දෙති. මේ සියළු කයිකතන්දරවලින් කියැවෙන්නේ එක් දෙයකි. එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙරට විනාශ කරඇති බව ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එ් චෝදනාවට පිළිතුරු දෙන්නේ හැකිනම් තම ප්‍රතිපත්ති වෙනස්කර ගැනීමට උත්සාහ දැරීමෙන් ය. එ් පක්ෂය සිංහලත්වයේ පක්ෂය බවට 1955 දී පමණ රූපාන්තරකරණය වුව ද පක්ෂ නායකත්වයට අර

© Prof. Nalin De Silva

අභියෝගයට මුහුණ දීමේ හැකියාවක් නැත. මෙරට දෙමළ ජාතිවාදය ආරම්භ වූයේ 1956න් පසුව නොවන බව අප කොතෙකුත් කරුණු සහිතව පෙන්නුම් කළ ද කසිකබල් ප්‍රබුද්ධයෝ එහි දී නෑසූ කන් ඇතිව පසුවෙති. ඔවුන්ගේ කන් සෙලවෙන්නේ බටහිර තාලවලට පමණ ය. ඒ කන්වල වරදකට වඩා ඔළුවේ පුරවාගත් බොරු දැනුම් බරවාය නිසා සිදුවන්නකි. ප්‍රංශයේ මුස්ලිම් ශිෂ්‍යාවනට තම ආගමික ඇඳුම ඇඳීම තහනම් කර තිබියදිත් ලංකාවේ නැති ආගමික නිදහසක් ප්‍රංශයේ ඇතැයි කියන්නෝ ඉඳහිට ලංකාවට පැමින බටහිරයන්ගේ වාදබයිලාවක් කියා ආපසු යති. චෙල්වනායගම් නම් දෙමළ ජාතිවාදියා ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවා ගත්තේ 1947 දී බව බොහෝ දෙනාට අමතක ය. ජී ජී පොන්නම්බලම් පණහට පණහ ඉල්ලුවේ තිස්ගණන්වල බව ප්‍රබුද්ධ බයිලාවල සඳහන් නො වෙයි. ජාතික ව්‍යාපාරයේ ඇතැමුන්ගේ ද සම්භාවනාවට පාත්‍ර වී ඇති පොන්නම්බලම් අරුණාශලම් එකල තිබූ ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි කොළඹට වෙනම දෙමළ මන්ත්‍රී ආසනයක් ජාතිවාදී පදනමකින් ඉල්ලා සිංහලයන් එයට විරුද්ධ වූ විට ජාතික සංගමයෙන් අස්වී දෙමළ මහජන සභාව නම් දෙමළ ජාතිවාදී සංවිධානය පිහිටුවූයේ 1921 දී බව සිංගප්පූරුවේ ලී ක්වාන් නොදැන සිටියාට ඊනියා ප්‍රබුද්ධයන් නොදැන සිටින්නට හේතු නැත. පොන්නම්බලම් රාමනාදන් මැනිං ආණ්ඩුකාරයා සමග එක්වී සිංහලයන් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බහුතරය බවට පත්වීම වැළැක්වූ අන්දම ද කසිකබල් පත්තරවලට ලියන්නන්ට අමතක ය. බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමෙන් ප්‍රශ්නය විසඳිය හැකිව තිබූ බව කියන්නෝ චෙල්වනායගම්ගේ දැන් ටිකක් පසුව හුගක් යන ප්‍රතිපත්තිය අමතක කරති. මේ සියල්ලටමත් වඩා මේ කරුණු හා තවත් බොහෝ දෑ දැතුළත් විශ්ලේෂණයක් ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා පොතෙහි සඳහන් බව ජාතික ව්‍යාපාරයේ යෙදෙන්නේ යැයි කියන සියළු දෙනාම පාහේ නොදනිති. ඒ අනුව ලියැවුණු පොත් හා ලිපි තිබුණ ද කිසිවකු ඒ පොතින් උද්ධෘතයක් ඉදිරිපත් කරනු මා දැක නැත.

1994 දී හැරෙන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයක් බලයට පත්වූ විට ඒ ආණ්ඩුව පළවා හැරීමට බටහිරයන් ඇතුළු විජාතික බලවේග ක්‍රියා කර ඇත. ඒ අවුරුද්දේ බලයට පැමිණි පොදු පෙරමුණු ආණ්ඩුවට විජාතික බලවේග ආධාර කෙළේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලවා ඊනියා පැකේජය දෙමළ ජාතිවාදයට පිළිගැන්වීමට ය. අනෙක් සෑම අවස්ථාවක දී ම විජාතික බලවේග ශ්‍රී ල නි ප ප්‍රමුඛ ආණ්ඩු බිඳ දැමීමට කටයුතු කර ඇත. මෙරට ආර්ථිකය බටහිර ඇතැම් සමාගමක ආර්ථිකයට ද වඩා කුඩා නිසා ඩොලර් බිලියන කිහිපයක් විසි කිරීමෙන් ආර්ථිකය හැසිරවීමේ හැකියාව බටහිරයන්ට ලැබී ඇත. ඒ හරහා ඔවුහු දේශපාලනය ද හසුරවති. සන්ධාන ආණ්ඩුව බලයට පත් වූ දින සිට ම බටහිරයන් ක්‍රියාකර ඇත්තේ ආණ්ඩුව වැට්ටවීමට ය. ඒ වෙන කිසිවක් නිසා නොව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලවා තමන්ට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමට තමන්ට නොහැකි බව ඔවුන් දන්නා නිසා ය. එයට හේතුව ඇය ජාතිමාමක කාන්තාවක් වීම නොව නමට හෝ ඇය ශ්‍රී ල නි පක්ෂයේ නායිකාව වීමත්, ඒ පක්ෂය නායකයන්ට පිටින් ගොස් සිංහලත්වයේ පක්ෂය වීමත්, ජ වි පෙ ආණ්ඩුවේ කොටස්කරුවකු වීමත් ය.

අද පෞද්ගලික බස් හිමියා ද, මුදලාලි ද, විදග්ධ (බටහිරට සාපේක්ෂව) ව්‍යාපාරිකයා ද, රාජ්‍ය නොවන සංවිධාන ද, බටහිරයෝ ද ආදී සියල්ලෝ ම ආණ්ඩුව වැට්ටවීමේ ඒකායන අරමුණෙන් ක්‍රියාකරති. ශ්‍රී ල නි ප ප්‍රමුඛ ආණ්ඩුවල යම් ජාතිකත්වයක් ඇත. බටහිරයන්ට නුරුස්සන්නේ ද මේ ජාතිකත්වය ය. අපට ඊනියා දියුණුවක් අත්කරගත නොහැකි ව ඇත්තේ ද මේ ජාතිකත්වය හේතුකොටගෙන මිස ලි ක්වාන් කදයන බයිලා නිසා නො වෙයි. එහෙත් අවාසනාවකට ශ්‍රී ල නි පක්ෂයට ජාතිකත්වයට එරෙහිව ක්‍රියාකරන බටහිරයන්ට විරුද්ධව කැප වී ජනතාව මෙහෙයවා විකල්ප ජාතික දියුණුවක් අත්කරගැනීමේ අධිෂ්ඨානයක් නැත. අද බටහිරයෝ ඩොලර් බිලියන හතළිස් එකකට රට පාවා දී ඊළම දීමට ආණ්ඩුවට බලකරති. එහෙත් ආණ්ඩුව ජනතාවට ඒ බව කියා ජනතාවගේ ශක්තිය ද ලබාගෙන බටහිරයන්ට අභියෝගකිරීමට ඉදිරිපත් නො වෙයි. මේ ශ්‍රී ල නි පක්ෂයේ ඊනියා මැදි පිළිවෙත ය. එය ජාතිකත්වයට යම් පක්ෂපාතීත්වයක් දක්වන අතර ම විජාතිකත්වයට විරුද්ධව නො යයි. රැවුලත් කැඳත් දෙකම බැරි බව ඒ පක්ෂය නොදන්නාසේ ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පුද්ගලික ආශාවන් ඉන්ද්‍රිය පිනවීම් වර්ධනය කර සමාජය පරමාණුකරණයකට ලක් කල ද එහි චින්තනය ඔස්සේ විජාතික බලවේග හා පුද්ගලයෝ එකට බැඳී සිටිති. ඔවුන් එකකු කරන දෙය අනෙකාට ද අවිඥානිකව මෙන් සන්නිවේදනය වෙයි. බස් හිමියා ද, බටහිර නිලධාරියා ද, දෙමළ ජාතිවාදියා ද එකට පැටලී සිටිති. බෙනෝට මුරලිදරන්ට දඬුවම්කිරීමට දේශපාලනය දැනගැනීමට අවශ්‍ය නො වෙයි~

© Prof. Nalin De Silva